## ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය

# කාර්යසාධන වාර්තාව - 2022

සම්පාදනය :

**සැලසුම් අංශය**

ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය

**24/4, කාසල් වීදිය,**

**කොළඹ 08.**

## 1.පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

### 1.1. හැඳින්වීම

ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය, 1974 වර්ෂයේ දී ආරම්භ වී වර්තමානය වන විට කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීමේ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ. 1978 වර්ෂයේදී ග්‍රාමසංවර්ධනය හා දිළිඳුකම පිටු දැකීමේ ක්‍රමෝපයක් ලෙස, සංවර්ධන ප්‍රවාහයෙන් ආන්තිකරණයට ලක් වූ දිළිඳු ප්‍රජාව, ඔවුන් සතු විභව ශක්තීන් ඉස්මතු කරමින් ඔවුන්ගේ ස්වශක්තිය හා සාමූහිකත්වය වර්ධනය කිරීම සඳහා සහභාගිත්ව සංවර්ධන සංකල්පය මත පදනම් වූ විපර්යකාරක කාර්යබද්ධ පුහුණු හා පර්යේෂණ වැඩසටහන තුළින් නව සංවර්ධන ක්‍රමවේදයක් හඳුන්වා දුන් ජාතික ආයතනයකි. නිෂ්පාදනයේදී, අලෙවියේදී, පරිභෝජනයේදී සහ ණය ක්‍රියාවලියේදී මෙන්ම ජන ජීවිතයේ වෙනත් කාරණාවන්වලදී ද අඩු ආදායම්ලාභී ප්‍රජාව මුහුණපාන අවාසිදායක තත්වයන් වාසිදායක තත්වයන් බවට පරිවර්තනය කර ගැනීමට අවශ්‍ය බලගැන්වීමේ උත්ප්‍රේරණ ක්‍රියාවලිය මෙම ක්‍රමවේදයේ ප්‍රධාන කාර්යභාරයකි. සහභාගිත්ව සංවර්ධන ක්‍රමවේදය ශ්‍රී ලංකාව තුළ ග්‍රාමසංවර්ධනය හා දිළිඳුකම පිටුදැකීමේ අරමුණින් ක්‍රියාත්මක සියලු ජාතික හා ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන් සඳහා ගලපාලීමට මෙම ආයතනය මූලික වී ක්‍රියාත්මකව ඇත. මෙම ක්‍රියාකාරිත්වය තුළ කාර්යබද්ධ පුහුණු හා පර්යේෂණ ක්‍රියාදාමය මූලික පදනම වූ අතර, එම කාර්යබද්ධ පුහුණු හා පර්යේෂණ ක්‍රියාදාමය ඔස්සේ සංවර්ධනය කරන ලද පුහුණු මාදිළි භාවිත කර ග්‍රාමීය හා ප්‍රාදේශීය මට්ටමින් සංවර්ධන කාර්යයේ නියුතු රාජ්‍ය, රාජ්‍ය නොවන හා ප්‍රජා සංවිධාන වැඩකරුවන් අභ්‍යාසකරණයට යොමු කිරීම තුළින් ප්‍රජාව සවිබලගැන්වීම සඳහා යොමුගත කොට ඇත. එසේම වර්තමානය වන විට මෙම ආයතනය ප්‍රායෝගික කුසලතාවන්ගෙන් හා ශාස්ත්‍රීය ඥානයෙන් පිරි මානව සම්පත මෙන්ම, නවීන පහසුකම්වලින් සමන්විත දේශන ශාලා, නේවාසිකාගාර හා පුස්තකාල වැනි භෞතික පහසුකම්වලින්ද සමන්විත වේ. කොළඹ 08, කාසල් වීදිය, අංක 24/4 දරන ස්ථානයේ ප්‍රධාන කාර්යාලය හා පුහුණු මධ්‍යස්ථානය ක්‍රියාත්මක වන අතර, ග්‍රාමසංවර්ධන මාවත, පිළිමතලාව යන ලිපිනයේද පුහුණු මධ්‍යස්ථානයක් ක්‍රියාත්මක වේ.

### 1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

**ආයතනයේ දැක්ම :**

**"සෞභාග්‍යමත් ශ්‍රී ලංකාවක් උදෙසා ප්‍රජාව සවිබලගැන්වීමේ ප්‍රමුඛ ආයතනය බවට පත්වීම"**

**ආයතනයේ මෙහෙවර :**

**"සහභාගිත්ව සංවර්ධන ක්‍රමවේදය භාවිත කරමින් ප්‍රජාව සවිබලගන්වා, තිරසාර සංවර්ධනය උදෙසා ඔවුන්ගේ සක්‍රීය සහභාගිත්වය උපරිම කිරීමට පුහුණු, පර්යේෂණ හා තොරතුරු සම්පාදනය තුළින් දායකවීම".**

## ආයතනයේ මෙහෙවරෙහි ප්‍රමුඛ පරාස

| ප්‍රජාවගේ ස්වශක්තිය හා සහභාගිත්වය වර්ධනය වීම. | කාර්යක්ෂමතාව හා ඵලදායීතාව වර්ධනයවීම. | නවෝත්පාදිත සංවර්ධන ප්‍රවේශයන් හා ප්‍රජා සංවර්ධනය පිළිබඳ දැනුම සමාජගත වීම. |
|---|---|---|

## ආයතනයේ අභිමතාර්ථ

1. ඉලක්ක ගත ප්‍රජාවගේ සමාජ ආර්ථික තත්ත්වය ඉහළ යෑම.
2. ප්‍රතිපත්ති සම්පාදකයින් /සංවර්ධනවේදීන් සඳහා තොරතුරු සම්පාදනය.
3. සේවා හා ක්‍රියාවලීන්හි ගුණාත්මක බව වර්ධනය වීම.
4. නව සංවර්ධන ප්‍රවේශයන් සමාජගත වීම.
5. නව නිෂ්පාදන හඳුන්වාදීම තුළින් තාක්ෂණය ප්‍රචලිත වීම.
6. ප්‍රජා සංවර්ධනය පිළිබඳ විද්වත් හා විශේෂඥ දැනුම සමාජගත වීම.

## ආයතන අරමුණු

මෙම ආයතනයේ අරමුණු ප්‍රධාන ධාරාවන් 03 ඔස්සේ දිව යයි. ඒවා නම්,

**01.** ප්‍රජා සංවර්ධනය පිළිබඳ දැනුම කළමණාකරනය

- ප්‍රජා සංවර්ධනය පිළිබඳ විද්වත් හා විශේෂ දැනුම සමාජගතවීම.
- පර්යේෂණ තුළින් සොයා ගන්නා ලද නව දැනුම සමාජගතවීම.
- පළාත් ග්‍රාම සංවර්ධනය පිළිබඳ නව වැඩසටහන් ක්‍රියාත්මකවීම.
- කුසලතා පූර්ණ පුහුණු හා පර්යේෂණ කාර්ය මණ්ඩලයක් ගොඩ නැංවීම.
- පුහුණු වැඩසටහන්වල ගුණාත්මකබව ඉහළ නැංවීමට ඉවහල්වන පුහුණු ආධාරක නිර්මාණය වීම.
- සංවර්ධන අත්දැකීම් ප්‍රකාශයට පත්කිරීම මගින් ප්‍රජාව දැනුවත් වීම.
- සංවර්ධන ක්‍රියාවලියේ වැඩ පියවර සැළසුම් වීම හා නව ක්‍රමෝපායන් බිහිවීම.
- යැපුම් මානසිකත්වය දුරුවීම.


**02.** **ප්‍රජා සංවර්ධන වැඩසටහන්වල කාර්යක්ෂමතාව සහ ඵලදායිතාව ඉහළයාම**

- ප්‍රජා සහභාගිත්වය වැඩිවීම.
- වියදම් අඩුවීම/ආදායම් වැඩිවීම /ඉතිරිකිරීම් වැඩිවීම.
- නව සංවර්ධන වැඩසටහන් නිර්මාණය වීම.
- ගෘහ කළමනාකරණය විධිමත් වීම.
- ප්‍රජා සංවිධාන ශක්තිමත් වීම.
- ග්‍රාමීය සම්පත් උපයෝජනය වැඩිවීම.
- අධ්‍යාපනය /සෞඛ්‍ය/පෝෂණ මට්ටම් ඉහළ යාම.

**03.** **නවෝත්පාදන සංවර්ධන ප්‍රවේශයන් හඳුන්වාදීම**

- කාර්යබද්ධ පර්යේෂණ.
- සමාජ පර්යේෂණ.
- නවෝත්පාදන උපාය මාර්ග.
- ග්‍රාමසංවර්ධනය සඳහා නව ක්‍රමවේද අත්හදා බැලීම.
- නිෂ්පාදන හඳුන්වාදීම තුළින් තාක්ෂණය ප්‍රචලිත කිරීම.
- නවෝත්පාදන තාක්ෂණික ක්‍රම සහ උපායමාර්ග හඳුනාගැනීම.
- නව ප්‍රජාමූලික සංවර්ධන ප්‍රවේශ හා ක්‍රමවේද සංවර්ධනය වීම.

## 1.4. සංවිධාන සටහන


අධ්‍යක්ෂ
නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂ (පාලන / සංවර්ධන)
නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂ(සැලසුම්)
පරිපාලන නිලධාරි
පුහුණු හා පර්යේෂණ නිලධාරි
පුහුණු හා පර්යේෂණ සහකාර
සංවර්ධන නිලධාරි
රාජ්‍ය කළමනාකරණ සහකාර
කා: කා: සහයක
රියදුරු
සනීපාරක්ෂක කම්කරු
මුරකරු

### 1.5. ආයතනය යටතේ පවතින අංශ

- පුහුණු අංශය
- පර්යේෂණ අංශය
- ප්‍රකාශන අංශය
- සැළසුම් අංශය
- පාලන හා ගිණුම් අංශය

### 1.6. ආයතනය යටතේ ඇති අරමුදල්

ආයතනය යටතේ අරමුදලක් නොමැති අතර, වාර්ෂික සැළැස්ම හරහා මහා භාණ්ඩාගාරයේ අරමුදල් මත වැඩසටහන් ක්‍රියාත්මක වේ.

### 1.7. විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු.

විදේශ ආධාර මත පදනම් වූ ව්‍යාපෘති ක්‍රියාත්මක නොවේ.

2 පරිච්ඡේදය

2022.12.31 දක්වා ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය

**01. පර්යේෂණ අංශය**

**1.1 "වර්තමාන වෙළෙඳපොළ උද්ධමනය අඩු ආදායම්ලාභී පවුල්වල අර්ථිකයට කර ඇති බලපෑම" පිළිබඳ සමීක්ෂණය.**

**1.2. පර්යේෂණ ගැටළුව**

ශ්‍රී ලංකාව නිදහස ලබා ගෙවුණු දශක හතක කාලය තුළ පෙර නොවූ විරූ සමාජ ආර්ථික හා දේශපාලනික මහා අර්බුදයකට මුහුණ පා සිටින අවධියක, රුපියල් ට්‍රිලියන 18 කට ආසන්න විදේශ ණය ශේෂයක් සහ දැඩි විදේශ සංචිත හිගයකට මුහුණ පා සිටී. මෙම පසුබිම තුළ මතුවී ඇති දැඩි ආර්ථික අර්බුදය නිසා 2022 ජුනිමස වනවිට කොළඹ පාරිභෝගික මිල දර්ශකයට අනුව මිල උද්ධමනය 54.6% දක්වා අති උද්ධමනකාරී (Hyperinflation))මට්ටමකට ලඟාවී ඇත. පවතින ආර්ථික අර්බුදය හමුවේ උද්ධමනකාරී පීඩනය තවදුරටත් තීව්‍ර වන බව ඇස්තමේන්තු කර ඇති අතර, එහිදී අවධානමට ලක්වන පවුල් 33 ලක්ෂයක් ඇතිබව හඳුනාගෙන ඇත. පවතින අති උද්ධමනය හේතුවෙන් අවධානම් පවුල්වල ආර්ථික තත්ත්වයට සිදුවන බලපෑම අවම කිරීම සඳහා සංවර්ධන වැඩසටහන් සැකසීමට පවතින තොරතුරු ප්‍රමාණවත් නැත.

**1.3.පොදු අරමුණ**

වර්තමාන ශ්‍රී ලංකාවේ පවතින ආර්ථික අර්බුදය තුළින් පැනනැගී ඇති උද්ධමනකාරී තත්ත්වය අඩු ආදායම්ලාභී පවුල්වල ආර්ථිකයට සිදුකරන බලපෑම හඳුනාගැනීම සහ එය අවම කිරීම සඳහා ග්‍රාමීය මට්ටමේ සංවර්ධන වැඩසටහන් සැලසුම් කිරීම.

**1. 3.1 විශේෂිත අරමුණ**

- ❖ පවතින වෙළඳපොල උද්ධමනය අඩු ආදායම්ලාභී පවුල්වල පරිභෝජනයට සිදුකර ඇති බලපෑම හඳුනා ගැනීමට.
- ❖ පවුලේ නිෂ්පාදනය/ආදායමට සිදුකර ඇති අහිතකර බලපෑම හඳුනා ගැනීමට.
- ❖ ප්‍රාග්ධන ආයෝජනයට සහ ඉතුරුම් සඳහා සිදුකර ඇති බලපෑම හඳුනාගැනීමට
- ❖ අඩු ආදායම්ලාභීන් නගා සිටුවීම සඳහා සංවර්ධන වැඩසටහන් සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය තොරතුරු සම්පාදනය කිරීමට

### 1. 4. ක්‍රියාත්මක ප්‍රදේශ:- අධ්‍යයන ප්‍රදේශය

අඩු ආදායම්ලාභීන්ගේ ආර්ථික ස්වභාවය හා උද්ධමනය අතර දැඩි සම්බන්ධයක් ඇති නාගරික ප්‍රදේශ නියෝජනය වන පරිදි පහත සඳහන් දිස්ත්‍රික්ක 05 ක් ආවරණය වන ලෙස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 15ක් මෙහි අධ්‍යයනය සඳහා යොදා ගෙන ඇත.

| අනු අංකය | දිස්ත්‍රික්කය | ප්‍රා: ලේ: කොට්ඨාසය | ග්‍රා .නි. වසම |
|---|---|---|---|
| 01 | කොළඹ | මහරගම | /497A රුක්මලේ(නැ) |
| | | | /497B රුක්මලේ(බ) |
| | | හෝමාගම | 448 වටරැක (ද) |
| | | | 482 පනාගොඩ |
| | | | /603B කිතුල්විල |
| | | කොලොන්නාව | /511A දහම්පුර |
| | | පාදුක්ක | /464C හොරකදවල |
| | | කඩුවෙල | 494 හෝකන්දර (උ) |
| 02 | ගම්පහ | මහර | /247C මහර නුගේගොඩ |
| | | වත්තල | /171B බලගල |
| 03 | කළුතර | කළුතර | 729 නාගොඩ (ද) |
| | | පානදුර | /708C පොතුපිටිය(බ) |
| 04 | කුරුණෑගල | කුරුණෑගල | 791 සියඹලාන්ගමුව |
| | | නාරම්මල | 1063 හාල් ඇල්ල |
| 05 | ගාල්ල | අක්මීමන | 155 හියාරේ(උ) |
| **එකතුව** | **05** | **12** | **15** |

### 1.5. මුහුණ දුන් අභියෝග හා ගැටළු :- අධ්‍යයනයේ සීමා

ශ්‍රී ලංකාව තුළ පවතින ආර්ථික අර්බුදය නිසා සාර්ව මට්ටමින් අති උද්ධමනකාරී තත්ත්වයන් පැනනැගී ඇති අතර අඩු ආදායම්ලාභී හා අවධානම් සහිත පවුල්වලට සිදුකරන බලපෑම් ඉතා ඉහළ මට්ටමක පවතී. එහෙයින් අඩු ආදායම්ලාභි ප්‍රජාවගේ ආර්ථික යහපැවැත්මට හා මූලික අවශ්‍යතා කඩවීමට ඇති අවධානම කෙරෙහි සැලකිළිමත් වී ඒ පිළිබද අධ්‍යයනය සඳහා ඉතා කුඩා නියැදියක් තෝරා ගැනීමට සිදුවීම මෙහි ප්‍රධාන සීමාවන් වේ. කුඩා නියැදියක් තුළින් ලබා ගන්නා දත්ත හා තොරතුරු මත සමහරවිට ගන්නා නිගමන පොදු තත්ත්වය පිළිබඳ නිවැරදි නියෝජනයන් සිදු නොවීම මෙහි තවත් සීමාකාරි තත්වයකි.

ඊට අමතරව රටතුළ පවතින ප්‍රවාහන ගැටළු නිසා පර්යේෂකයින්ට ක්ෂේත්‍ර අධ්‍යයන සඳහා සහභාගිත්වය පහසුව අනුව භූගෝලීය ප්‍රදේශයන් තෝරා ගැනීමට සිදුවීම තවත් මෙම අධ්‍යයනයේ සීමාවක් ලෙස දැක්විය හැකියි.

### 1.6 නිගමන

නියැදිය තුළ සිටින ශ්‍රම බලකායට අයත් ජනගහනය ජාතික මට්ටම හා සැසඳීමේ දී ඉහළ අගයක් පෙන්වන මුත්, ඵලදායී ආර්ථික කටයුත්තක නියැලී නොසිටින වැඩිහිටි ජනගහනය ජාතික මට්ටම හා සැසැදීමේදී ඉහළ අගයක් ගන්නා හෙයින් ඔවුන්ගේ පෝෂණය හා සෞඛ්‍ය සුරක්ෂණය අසීරු කරුණක් වී ඇත.

රාජ්‍ය සේවයේ කම්කරු මට්ටමේ රැකියාවල නියුතු වූවන් ද, අඩු ආදායම්ලාභීන් මුහුණ දෙන ආර්ථික තත්ත්වය හා සමාන තත්ත්වයක පසුවන හෙයින්, ඔවුන්ගේ ජීවන තත්ත්වය පහත් මට්ටමක පවතී.

ශ්‍රම බලකායට ඇතුළත් මුත්, සේවා වියුක්ත 155 දෙනෙකු සිටින හෙයින් මෙම පවුල්වල යැපුම් අනුපාතය 86.12% ක් වැනි ඉහළ අගයක් ගනියි. මෙම තත්ත්වය නිර්මාණය විමට පවතින ආර්ථික අර්බුදයෙන් රැකියා අහිමිවීම හේතු වී ඇත.

විධිමත් පුද්ගලික අංශයේ සේවා නියුතු වූවන්ගේ රැකියා සුරක්ෂිතතාව තහවුරු වුවත්, වැටුපට අමතරව මෙතෙක් ලබාදුන් දිරිදීමනා, පැමිණීමේ දීමනා, ප්‍රසාද දිමනා , ආදිය අත්හිටුවා ඇති හෙයින්, ඔවුන්ගේ මූල්‍ය ආදායම පහළ යැමත් සමඟ මුදලේ මූර්ත වටිනාකම (ක්‍රය ශක්තිය ) හීනවීම නිසා එම පවුල්වල ජීවන තත්ත්වය පහත වැටී ඇත.

ග්‍රාමීය විරැකියාව ඉහළ මට්ටමක පවතින අතර, එයට කොවිඩ් 19 වසංගත තත්ත්වය හා ආර්ථික අවපාතය ප්‍රධාන හේතු ලෙස අනාවරණය වුවත්, ග්‍රාමීය කාන්තාවන් හට රැකියා සඳහා අවස්ථා පැවතිය ද, ස්වේච්ඡාවෙන් සේවා වියුක්තවීමට ඇති කැමැත්ත නිසා ඔවුන්ගේ ආර්ථික තත්ත්වය පිරිහී ඇත.

නියැදිය තුළ ශ්‍රම බලකායට අයත් ජනගහනය ජාතික මට්ටම හා සැසඳීමේදී ඉහළ අගයක් පෙන්වන බැවින් මෙම පවුල්වල යැපුම් අනුපාතය අඩු මට්ටමක පැවතිය ද , වැඩිහිටි ජනගහනය ජාතික මට්ටම හා සැසඳීමේදි ඉහළ අගයක් පෙන්වන බැවින් ඵලදායි ආර්ථික ක්‍රියාකාරමක නිරත නොවිම නිසා ඔවුන් පෝෂණය කිරිමට වැඩි පිරිවැයක් දැරිමට සිදු වී ඇත.

නියැදි පවුල්වල සාමාජිකයන් 464 දෙනෙකු හෙවත් 54.8%ක් වැනි ඉහළ අගයක් ද්විතියික හෝ ඊට ඉහළ අධ්‍යාපනය ලැබූ පිරිසක් සිටීම යහපත් අධ්‍යාපන තත්ත්වයක පසුවන බවට සාක්ෂියකි. ඒ අනුව 6 වන ශ්‍රේණියේ සිට ඉහළ අධ්‍යාපනයක් ඇති 680 දෙනෙකු සිටින අතර, ඔවුන්ගේ සාක්ෂරතාව 78.90%ක් වැනි ඉහළ අගයක් පෙන්නුම් කරයි.

අධ්‍යාපන කටයුතු සඳහා විශාල මුදලක් වැය කිරීමට සිදුවීම හේතුවෙන් ආහාර පරිභෝජනය දැඩි ලෙස සීමා කර ඇති අතර.ඒ හේතුවෙන් පෝෂණ තත්ත්වය ගිලිහී ගොස් ඇත ,

පොත්පත්/පාසල් උපකරණ වියදම්, බාහිර පන්ති ගාස්තු, ප්‍රවාහන වියදම්, මාර්ගගත පන්ති සඳහා සන්නිවේදන වියදම් හා ආහාර වියදම් සපයා ගැනීමට උපයන ආදායම් ප්‍රමාණවත් නොවීම හේතුවෙන් අධ්‍යාපන වයසේ දරුවන්ගේ අධ්‍යාපන කටයුතු අඩාලවී ඇත.

ඉහළ යන අධ්‍යාපන වියදම සමනය කර ගැනීම සඳහා දරණ උත්සාහයේ ප්‍රතිඵලයක් ලෙස ආහාර හා පෝෂණය අඩු මට්ටමක පවතී.

අඩු ආදායම්ලාභින්ගේ ජනවාරි - ජූලි මාස (06) හය තුළ ආහාරමය ද්‍රව්‍ය සඳහා පාරිභෝජන වියදම 25% ක ප්‍රමාණයකින් ඉහළ ගොස් ඇති අතර, වෙළෙඳපොළ තුළ පවතින උද්ධමනය සමනය කරගැනීම සඳහා ප්‍රෝටීන් හා විටමින් වැනි අත්‍යවශ්‍ය ආහාර පාරිභෝජනය දැඩි ලෙස සීමා කිරීම හා අත්හැරීමට පෙළඹීම නිසා අනාගතයේදී කුඩා දරුවන්, ගැබිනි හා කිරිදෙන මව්වරුන්ගේ සහ වයෝවෘද්ධ වැඩිහිටියන්ගේ පෝෂණ හා සෞඛ්‍යමය ගැටලු තීව්‍ර වීමේ අවධානමක් ඇත.

උද්ධමනයේ බලපෑම හේතුවෙන් 2022 ජනවාරි මස වන විට, දිනකට ලබාගත් ආහාර වේල් සංඛ්‍යාවට සමාන වේල් සංඛ්‍යාවක් 2022 ජූලි වන විට ලබා ගැනීමට අඩු ආදායම්ලාභීන් අසමත් වී ඇත. එසේම ලබා ගන්නා ආහාර

වේල් පිළිබඳව ජනතාවගේ තෘප්තිය ද පහළ ගොස් ඇත. එහෙයින් පෝෂණය පමණක් නොව ජනතාවගේ සතුට හා වින්දනය ද පිරිහී ඇත.

ප්‍රධාන ආහාරයට අමතරව ගත් අතිරේක ආහාරවල මිල ගණන් සීඝ්‍ර ලෙස ඉහළයෑම හා පවතින ආදායම තුළින් ප්‍රධාන ආහාර වේල මිලදි ගැනීමෙන් පසු අතිරේක ආහාර ලබා ගැනීමේ ක්‍රය ශක්තිය පිරිහීම නිසා අතිරේක ආහාර පාරිභෝජනය අවම කර හෝ එයින් බැහැරවී ඇත. ඒ නිසා ජනතාවගේ පෝෂණය හා තෘප්තිය පිරිහී ඇත.

උද්ධමනකාරී වාතාවරණය තුළ ආදේශන ආහාර මිල, හාල් මිලට සාපේක්ෂව වැඩි ප්‍රතිශතයකින් ඉහළ ගිය හෙයින් ප්‍රධාන ආහාරය ලෙස විකල්ප ආහාර පාරිභෝජනය අඩු කර බත් පරිභෝජනය සඳහා වැඩි පිරිසක් පෙළඹී ඇත.

අඩු ආදායම්ලාභියාගේ ක්‍රය ශක්තියේ පිරිහීම හේතුවෙන් එක් වේලකට ගන්නා එළවළුවල සංඛ්‍යාව සීමාකර ඇත. මෙම තත්ත්වය ඔවුන්ගේ පවුල්වල පෝෂණ මෙන්ම ආහාර පාරිභෝජන තෘප්තියේ පහත වැටීමක් ඇත.

අඩු ආදායම්ලාභින්ගේ ක්‍රය ශක්තිය පිරිහීම මත දෛනිකව ලබාගන්නා සත්ව ප්‍රෝටීන් සහිත ආහාර වේල් සංඛ්‍යා දැඩි ලෙස සීමාකර හෝ අත්හිටුවා ඇත. මෙම තත්ත්වය දිගු කාලයේදී වැඩෙන කුඩා දරුවන්ව, ගැබිනි හා කිරිදෙන මව්වරුන්ට සහ වයෝවෘද්ධ හා රෝග පීඩාවලින් පෙලෙන අයවලුන් හට දැඩි බලපෑම් එල්ලවීමට හේතුවේ.

අධ්‍යනයට ලක්කළ සමස්ත පවුල්වලින් ඉතා සුළු පිරිසකගේ හැර බහුතරයකගේ පවුල්වල සාමාජිකයන්ගේ ආහාර හා මූලික අවශ්‍යතා ඉටු කර ගැනීමේ ගැටලු පැන නැගී ඇත.

ආබාධිත හා නිදන්ගත රෝගවලින් පෙලෙන සාමාජිකයින් හට ඖෂධ මිලදී ගැනීමේ විවිධ දුෂ්කරතා පැනනැඟී ඇති අතර ඊට මුහුණදීම සඳහා ඖෂධ භාවිතය අත්හිටුවා ඇත. ඖෂධ මිළදී ගැනීමේදී මසකට නිර්දේශීත ප්‍රමාණය වෙනුවට එකවර වැඩි මුදල් ප්‍රමාණයක් යෙදවීමට නොහැකි හෙයින් සතියකට අවශ්‍ය ප්‍රමාණය පමණක් මිලදී ගැනීමට යොමුවී ඇත. එසේම සායන හා ආරෝග්‍යශාලාවලට යෑමේදී දැරීමට සිදුවන අධික ප්‍රවාහන වියදම් හේතුවෙන් අත් බෙහෙත් හා ආයුර්වේද බෙහෙත් භාවිතයට පුරුදුවී ඇත. ඖෂධ, සෞඛ්‍ය යහපැවැත්ම සඳහා ගන්නා උපකරණ වෙනුවෙන් දැරීමට සිදුවන පිරිවැය අධික වීම නිසා රෝගාබාධ උත්සන්න වී විවිධ සංකූලතා පැන නැඟීම හේතුවෙන් ජීවිත අපේක්ෂාව බිඳ වැටී ඇත.

තම දරුවන්ගේ රැකියා හා ව්‍යාපාර අස්ථාවර වීම හේතුවෙන් ඔවුන්ගෙන් මෙතෙක් කල් යැපුණු වැඩිහිටියන් හට ලැබුණු මුදල් නැවතීයෑමෙන් එකී වැඩිහිටියන්ගේ ජීවන තත්වය හා සෞඛ්‍යය තත්ත්වය සහමුලින්ම කඩා වැටී ඇත.

නිදන්ගත රෝගී තත්ත්වයෙන් හා ආබාධිත තත්ත්වයෙන් පසුවන පුද්ගලයින්හට සෞඛ්‍යය සුරක්ෂණය සඳහා වැය කිරීමට ප්‍රමාණවත් ආදායමක් නොමැති වීම හේතුවෙන් ඔවුන්ගේ සෞඛ්‍ය තත්ත්වය වඩා අයහපත්වී ජීවත්වීම පිළිබඳ පවතින අපේක්ෂා බිඳ වැටී ඇත.

ඉන්ධන මිල හා ප්‍රවාහන ගාස්තු උද්ධමනකාරී වාතාවරණය තුළ ඉතා සීඝ්‍රයෙන් ඉහළ ගොස් ඇති අතර, අඩු ආදායම්ලාභින් එය සමනය කර ගැනීම සඳහා වියදම් අවම ප්‍රවාහන මාධ්‍යය වෙත යොමුවී ඇත. නමුත් එදිනෙදා කටයුතු ඉටු කර ගැනීමට ඇති හැකියාව පිළිබඳව සෑහීමටපත් නොවෙති.

එදිනෙදා කටයුතු සිදු කර ගැනීමේදී දැරීමට සිදුවන අධික ප්‍රවාහන පිරිවැය පාලනය කරගැනීමට ගමන් බිමන් සීමා කර ඇතිමුත්, ජීවනෝපාය කටයුතු වෙනුවෙන් දැරීමට සිදුවන ප්‍රවාහන වියදම අධික ලෙස ඉහළ ගොස් ඇති හෙයින් ඔවුන් උපයන ආදායමින් වැය කිරීමට සිදුවන අමතර පිරිවැය ජීවන තත්ත්වයට බලපා ඇත.

කුලී රථ ගාස්තු හා ඉන්ධන මිල ඉහළ යෑම හේතුවෙන්, කුලී රථ, ත්‍රිවීල්, මෝටර් බයිසිකල් භාවිතය සීමා කර පොදු ප්‍රවාහනය හෝ පා ගමනින් යෑම තුළින් වියදම් අවම කර ගැනීමට උත්සාහ කර ඇතිමුත් ඒ වෙනුවෙන් කැප කරන කාලය ඵලදායි ආර්ථික කටයුත්තක යෙදවීමට නොහැකි වී ඇත.

අඩු ආදායම්ලාභී පවුල් 210කින් එක් පවුලක් හැර සෙසු පවුල්වල ස්වාමියා යම් ඵලදායී ආර්ථික කටයුත්තක නිරත වී සිටිනමුත්, බොහෝ කාන්තාවන්හට අවස්ථාවන් හා හැකියාවන් පැවතියත් ඵලදායී ආර්ථික කටයුතුවල නිරතවීමට මැළිකමක් දක්වති.

නියැදියට අයත් පවුල්වලින් ඵලදායී ආර්ථික කටයුතුවල නිරත පවුල් 209ක් හෙවත් 81.34% ක් සිටින අතර, ඔවුන්ගේ මාසික ආදායම හා රැකියාවේ සුරක්ෂිතතාව ගිලිහී ගොස් අවදානමට ලක්වී සිටින අතර, එයින් බහුතර පිරිසක් ස්වයංරැකියා හා කුලී කම්කරු වෘත්තීන්වල නිරතවී සිටිති.

2021වර්ෂයට සාපේක්ෂව 2022 වර්ෂයේ දී ස්වයංරැකියා අඩපණ වීම ,ඉදිකිරීම් ,කම්කරු රැකියා අහිමි වීම , ,කර්මාන්තය කඩාවැටීම හා ඉන්ධන හිඟය නිසා කුලී රථ ධාවනය අඩාල වීම රසායනික පොහොර හිඟකම , නිසා ඵලදාව අඩුවීම සහ විධිමත් පුද්ගලික අංශයේ වැටුප් මූලික වැටුපට සීමා වීම ආදී හේතු නිසා 2022 .වර්ෂයේ ආදායම රු 7143.00ක් හෙවත් 17.08%කින් පහළ බැස ඇත.

2021උපයන ආදායමෙන් මූලික අවශ්‍යතා අවම මට්ටමින් වත් සපුරා ගැනීමට නොහැකි බව 204 දෙනෙකු හෙවත් 97.14%ක් ප්‍රකාශ කරන ලදී .

ජීවන වියදම දිනෙන් දින ඉහළයෑම නිසා විවිධ ආර්ථික අපහසුතාවලට ලක් වුවත් පවුලේ එක් පුද්ගලයෙකු , කලත්‍රයාහට රැකියාවක් කිරීමේ හැකියාවක් පැවතිය ද සේවා ,පමණක් ආදායම් ඉපයීමට යොමුවී ඇති අතර .වියුක්ත තත්ත්වයේ තවදුරටත් සිටීමට උත්සාහ දරයි

ආබාධිත තත්ත්වයේ හෝ නිධන්ගත රෝගී තත්ත්වයේ පසුවන පවුල්වල ආර්ථික දුෂ්කරතා දැඩි මට්ටමක පවතී.

කාන්තා මූලික පවුල්, මවුපියන් අහිමි පවුල් හා වයෝවෘද්ධ දෙමව්පියන් සහිත පවුල් දැඩි ආර්ථික අර්බුදයකට මුහුණ පා ඇති අතර ඒ හේතුවෙන් ඔවුන්ගේ ආහාර හා පෝෂණ කටයුතු පමණක් නොව දරුවන්ගේ අධ්‍යාපන , .කටයුතුවලට ද දැඩි බාධා එල්ලවී ඇත

ස්ථාවර ආදායම් ලබන පවුල්වල පාරිභෝජනය හා ජීවන තත්ත්වය ඉතා පහළ මට්ටමකට පත්වී ඇත.

උපයන ආදායම දිනෙන් දින පහල යෑම හා ඉහළ යන ජීවන වියදම හමුවේ පරිභෝජනය අවම මට්ටමකින්වත් රඳවා ගැනීමට බහුතර පවුල් සංඛ්‍යාවක් අපොහොසත් වීම.

ආදායම අඩු මට්ටමක පැවතියත් බාහිර පාර්ශවවල ආධාර හා උපකාර ලැබීම හේතුවෙන් එදිනෙදා කටයුතු යම් මට්ටමකින් පවත්වා ගැනීමට හැකි සීමිත පවුල් සංඛ්‍යාවක් සිටිති.

තනි පුද්ගල පවුල්වලට මෙම ආර්ථික උද්ධමනය අඩු මට්ටමකින් බලපෑම.

කෘෂි කර්මාන්තය ප්‍රධාන ජීවනෝපාය කරගත් අයවලුන් හට වර්තමානයේ වෙළඳපොල තුළ පවතින කෘමිනාශක හා රසායනික පොහොර හිඟය හේතුවෙන් දැඩි ආර්ථික අපහසුතාවලට මෙන්ම ආහාර හිඟයට ද මුහුණ පෑමට සිදු වීම.

අඩු ආදායම්ලාභීන්ගේ සමාජ ආර්ථික අවශ්‍යතා කඩවීම හේතුවෙන් ආධ්‍යාත්මික හා මානසික ගැටලු ඇතිවී පවුල තුළ අඬදබර, නොරිස්සුම් හා නොසලකා හැරීම් නිර්මාණයවී පවුලේ ඒකාබද්ධතාව ගිලිහී ගොස් ඇත.

2021 වර්ෂය වන තෙක් මුදල් ඉතිරිකිරීමට පෙළඹී ඇති මුත් 2022 වර්ෂය තුළ උපයන ආදායමින් අත්‍යවශ්‍ය වියදම් වෙනුවෙන් මුදල් වැය කිරීමෙන් පසු අමතර මුදලක් ඉතිරි නොවන අතර, 2022 වර්ෂයට පෙර තැන්පත් කර තිබූ මුදල් ඖෂධ හා දරුවන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා ආපසු ලබාගැනීමට පෙළඹී ඇත..

වර්තමාන වෙළෙඳපොල උද්ධමනය හමුවේ සහනාධාරලාභීන් ලබන මුදල තම ආහාර වේල සපයා ගැනීමටවත් ප්‍රමාණවත් නොවන අතර, සහනාධාර මුදලේ ක්‍රයශක්තිය දිනෙන් දින පහළ යමින් පවතින හෙයින් මූල්‍ය සහනාධාර වෙනුවට භාණ්ඩ සහනාධාර වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම වඩා ඵලදායී වේ. විශේෂයෙන්ම වයෝවෘද්ධ පවුල්වල ප්‍රධාන ආදායම සහනාධාර මුදල් වන අතර, ඔවුන්ගේ ජීවන තත්ත්වය ඉතා අසතුටුදායක තත්ත්වයට පත්වී ඇත.

ස්වයංරැකියා හෝ වෙනත් ආයෝජන මාධ්‍යයන් තුළ ආයෝජනයට යොමු නොවන අතඊ, උපයන ආදායම ආයෝජනයට ප්‍රමාණවත් නොවීම හා තම රැකියා 2020 වර්ෂයේ සිට අඩපණවීම එයට හේතුවී ඇත.

අඩු ආදායම්ලාභීන් වැඩි පිරිසක් ස්වයංරැකියාවල නිරතවූවත් ඒවා තුළින් තම පවුලට එක් කරන ආර්ථික දායකත්වය අඩු මට්ටමක පවතී. ප්‍රධාන ආදායම් මාර්ගයට අතුරු ආදායම් මාර්ගයක් ලෙස ඒවා පවත්වාගෙන යාමට උත්සාහ කිරීම නිසා ලබාදෙන ප්‍රමුඛතාවය අඩුවීම සහ නිෂ්පාදනය අඩාල වීම එයට හේතු වේ.

2021 වර්ෂය තුළ කොරෝනා වසංගතය පැවැති පරිසරයක වුවත්, ස්වයංරැකියා අඛණ්ඩව පවත්වාගෙන යෑම හොඳ මට්ටමක පැවැති අතර, 2022 වර්ෂය තුළ පවතින උද්ධමනය, ආර්ථික අවපාතය, නිෂ්පාදන සාධක හිඟය, ප්‍රවාහන ගාස්තු ඉහළයෑම සහ පාරිභෝගික ක්‍රය ශක්තියේ පිරිහීම හේතුවෙන් ව්‍යවසායන් අඛණ්ඩව පවත්වාගෙන යෑමට අසීරුවී ඇත.

ග්‍රාමීය ව්‍යවසායකයින්ගේ නිෂ්පාදන සාධක පිරිවැය උද්ධමනකාරී වාතාවරණය තුළ දැඩි ලෙස ඉහළ ගිය මුත්, ඊට සමානුපාතිකව නිෂ්පාදිත භාණ්ඩ සඳහා ඉහළ මිල ගණන් ගෙවීමට පාරිභෝගිකයා අකමැති හෙයින් එම නිෂ්පාදන කර්මාන්ත අඩාලවී ඇත.

උද්ධමනකාරී තත්ත්වය තුළ බොහෝ ස්වයංරැකියා අධෛර්මත්වී ඇතත්, ඒවා යාවත්කාලීන කිරීම හා යථාවත් කිරීම සඳහා අවශ්‍ය ප්‍රාග්ධන සම්පාදනයේ පවතින සීමාකම් ප්‍රධාන ගැටලුවකි. එසේම බැංකු මගින් අඩු ආදායම්ලාභීන් සඳහා සහනදායී පොලී අනුපාතිකයන් යටතේ ණය ලබාදීමටත්, ලබාදුන් ණය සඳහා පොලිය කපා හැරීම හා ආපසු ගෙවුම් කාලය දීර්ඝ කිරීමටත් සමෘද්ධි බැංකුව හෝ වෙනත් රාජ්‍ය බැංකු අසමත්වී ඇත.

අඩුආදායම්ලාභීන්ගේ ව්‍යවසායන් පවතින උද්ධමනකාරී වාතාවරණය තුළ අධෛර්යමත්වී ඇති හෙයින්, ඒවා යාවත්කාලීන කිරීම හා දිරිගැන්වීම සඳහා ප්‍රාග්ධන අවශ්‍යතාව දැඩිව පවතී. සමෘද්ධි බැංකුව තුළින් ණය අධෛර්මත්කර ඇති අතර, ස්වයංරැකියා ණය පොලී අනුපාතිකය ඉහළ දැමීම ව්‍යවසායකයින් තවදුරටත් අධෛ්‍යයමත්වීමට හේතුවී ඇත. මීට පෙර ලබාගත් හිඟ ණය ශේෂයන් ආවරණය සඳහා සමෘද්ධි ප්‍රතිලාභීන්ගේ සහනාධාර මුදල් බැර කිරීම නිසා ආහාර සම්පාදනයට ගැටලු පැන නැගී ඇත.

**පවතින අර්බුදකාරී තත්ත්වය සමනය සඳහා පහත සඳහන් ක්‍රියා මාර්ග ගෙන ඇත.**

- උපයන ආදායම හා ආදායමේ ක්‍රය ශක්තිය හීනවීම හේතුවෙන් ප්‍රධාන ආහාර වේලට අමතරව මෙතෙක් ලබාගත් අතිරේක ආහාර හා කිරිපිටි භාවිතය නවතා ඇත.
- ආහාර සඳහා වැය වැයකරන මුදල් සීමා කිරීමට පෙලඹී ඇති අතර, ගෑස් භාවිතය වෙනුවට දර භාවිතයෙන් ඉවුම් පිහුම් කටයුතුවලට පෙළඹී ඇත.
- උපයන ආදායමෙන් ආහාර පරිභෝජනය සඳහා වැය කිරීමෙන් පසු අමතර මුදලක් ඉතිරි නොවීම ඉන්දන , මිල හා ප්‍රවාහනය වියදම් ඉහළයෑම හේතුවෙන් ගමන් බිමන් හා සමාජ කටයුතු දැඩි ලෙස සීමා කර ඇත.
- බිත්තරක ,මාංශ ,මස් ,රවල වැනි ආහාරයට ප්‍රෝටීන් එකතු කරන බොහෝ ආහාර ද්‍රව්‍ය පාරිභෝජනය දැඩි ලෙස සීමා කර හෝ සහමුලින්ම නවතා දමා ඇත.
- කිරි ආහාර පලතුරු හා අතුරුපස වැනි භාණ්ඩවල මිල සීඝ්‍ර ලෙස ඉහළයෑම හා උපයන ආදායමෙන් ඒවා , මිලදී ගැනීමට ප්‍රමාණවත් මුදලක් ඉතුරු නොවීම හේතුවෙන් එම ආහාරපාරිභෝජනය දැඩි ලෙස සීමා කර ඇත.
- ප්‍රධාන ආහාරය වන බත් වෙනුවට මෙතෙක් භාවිතා කළ විකල්ප ආහාරවල මිල ගණන් ඉහළ යෑම හේතුවෙන් බත් පමණක් ආහාරයට ගැනීමට පෙළඹී ඇත .
- ආහාර සඳහා දරණ පිරිවැය අවමකර ගැනීම සඳහා ගෙවතු වගාවට යොමුවීමේ ප්‍රවණතාවක් ඇත.
- දෛනික කුලීජංගම හා විදී වෙ ,ළඳාම වැනි අතිරේක විකල්ප ආදායම් මාර්ගවලට යොමුවී ඇත.
- විනෝද ප්‍රියසම්භාෂණ හා සමාජ සම්බන්ධතා අතහැර එකී මුදල අත්‍යාවශ්‍යය පාරිභෝජන කටයුතු සඳහා, .යොමුකර ඇත

## 1.7 ඉදිරි ක්‍රියාමාර්ග සඳහා යෝජනා

පවතින ආර්ථික අවපාතය හා වෙළෙඳපොල උද්ධමනය හමුවේ අඩු ආදායම්ලාභී පවුල් තුළ දැඩි ආර්ථික අර්බුද හා ගැටලු නිර්මාණය වී ඇති අතර, මෙම පර්යේෂණය තුළින් අනාවරණය කරගත් පර්යේෂණ සොයාගැනීම් පාදක කර ගනිමින් එකී ගැටලු සමනය කිරීම සඳහා සාර්ව මට්ටමින් ක්‍රමෝපායන් අනුගමනය කිරීම උගහට හෙයින්, ඊට විකල්පයක් ලෙස ග්‍රාමීය මට්ටමින් ක්‍රියාත්මක කළ හැකි ක්ෂුද්‍ර ආර්ථික සංවර්ධන වැඩසටහන් සඳහා යෝජනා පහත දැක්වේ.

බහුතර පවුල් සංඛ්‍යාවක ස්වාමියා පමණක් ඵලදායී ආර්ථික කටයුත්තක නියැලී සිටින මුත් බිරිඳ නිවසේ එදිනෙදා කටයුතුවලට පමණක් සීමාවී ස්වේච්ඡාවෙන් ආදායම් ඉපයීමේ කටයුතුවලින් බැහැරවී සිටීම හේතුවෙන් එම පවුල් තුළ ආර්ථික දුෂ්කරතා ඉහළ මට්ටමක පවතින හෙයින් සේවා වියුක්ත කාන්තාවන් සඳහා වෘත්තීය

මාර්ගෝපදේශනය තුළින් ස්වයංරැකියා, දේශීය පුද්ගලික අංශයේ රැකියා හෝ විදෙස් රැකියා සඳහා යොමු කිරීමේ වැඩසටහන් ග්‍රාමීය හා ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාත්මක කළ යුතුවේ.

රාජ්‍ය සේවයේ කම්කරු මට්ටමේ රැකියාවල නියුතු වූවන් ද, අඩු ආදායම්ලාභී මුහුණ දෙන ආර්ථික තත්ත්වය හා සමාන තත්ත්වයක පසුවන හෙයින්, බොහෝ සහනාධාර වැඩසටහන්වලින් එවැනි පිරිස් ඉවත් කරනු ලැබුවත්, ඔවුන්ගේ ජීවන තත්ත්වය ආරක්ෂා කිරීම සඳහා සහනාධාර වැඩසටහන්වලින් ආවරණයක් සැලසීම අත්‍යාවශ්‍ය වේ.

ආර්ථික හැකියාවක් ඇති අයගේ දායකත්වය මත අධ්‍යාපන කටයුතුවලදී දැඩි දුෂ්කරතාවන්ට පත්වී ඇති දරුවන් සඳහා ප්‍රාදේශීය හා ග්‍රාමීය මට්ටමින් ආධාරක වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

ග්‍රාමීය මට්ටමෙන් ස්වේච්ඡාවෙන් ඉදිරිපත්විය හැකි සුදුසුකම් ලත් හා හැකියාව සහිත පිරිසගේ දායකත්වය මත උපකාරක පන්ති සඳහා සහභාගිවීමට ආර්ථික දුෂ්කරතා ඇති දරුවන්හට නොමිලයේ උපකාරක පන්ති පැවැත්වීමට වැඩපිළිවෙලක් සැකසීම හා උපකාරක පන්ති ආචාර්යවරුන් වෙතින් නිදහස් මාසික ප්‍රවේශපත් (Free cards) ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතුය.

පාසල් දිවා ආහාරය සපයා ගැනීමට අසමත් දරුවන් සඳහා දෙමාපියන්ගේ සහ ගුරුවරුන්ගේ ස්වේච්ඡා දායකත්වය මත ආහාර බෙදාදීමේ වැඩසටහන් පාසල් මට්ටමින් ක්‍රියාත්මක කළ යුතුය.

වෙළෙඳපොල තුළ ආහාරමය ද්‍රව්‍ය මිල ගණන් සීග්‍රයෙන් ඉහළගොස් ඇති පසුබිමක් තුළ පිරිවැය අවම කිරීම සඳහා සහ පෝෂණ මට්ටම ආරක්ෂාකර ගැනීම සඳහා ගෘහස්ත මට්ටමින් පාරිභෝජන කළමනාකරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

ආහාර කාණ්ඩයේ උද්ධමනය හේතුවෙන් මස්, මාළු,කිරි,බිත්තර,කරවල වැනි සත්ව ප්‍රෝටීන් බහුල ආහාර පාරිභෝජනය සීමා කිරීම හෝ අත්හිටුවීම නිසාවෙන් කුඩා දරුවන්ගේ,ගැබිනි හා කිරි දෙන මව්වරුන්ගේ,වයෝවෘද්ධ හා රෝගී අයගේ පෝෂණ හා සෞඛ්‍ය ගැටලු තීව්‍ර වී ඇති හෙයින් මෙකී ආහාර පාරිභෝජනයේ වැදගත්කම හා ප්‍රමුඛතාව පිළිබඳ ග්‍රාමීය මට්ටමින් ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

ආහාර වේලේ ප්‍රමාණාත්මක බව,ගුණාත්මක බව හා තෘප්තිය ඉහළ නැංවීම සඳහා අඩු පිරිවැය සහිත සුරක්ෂිත ආහාර වේලක් ලබා ගැනීම සඳහා ඇති අයිතිය තහවුරු කිරීමේ වැඩසටහන් ග්‍රාමීය මට්ටමින් ක්‍රියාත්මක කිරීම.

ආහාර සහජීවනය සහ ආහාර සුරක්ෂිතතාවය (කල්තබා ගැනීම) පිළිබඳ ජනතාවගේ දැනුම,කුසලතා හා ආකල්ප වැඩිදියුණු කිරීම.

වෙළෙඳපොල තුළ තීරණය වූ මිලක් යටතේ ආහාරයට ගන්නා ප්‍රධාන ආහාරවලට (හාල් සහ තිරිඟු පිටි ආශ්‍රිත) විකල්ප හෝ ආදේශක ලෙස අල, බතල හා එළවළු වැනි භෝග වගා කිරීම හා අඩු පිරිවැයකින් සපයා ගැනීම සහ කොස් දෙල් වැනි ආහාර ප්‍රජාව අතර ප්‍රචලිත කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

අතිරේක ආහාර පාරිභෝජනය අත්හිටුවීම හා සීමාකිරීම මත ඇතිවන පෝෂණ ඌනතා මගහැරවීම සඳහා ප්‍රධාන ආහාර වේලට අමතරව ලබා ගන්නා අතිරේක ආහාර වශයෙන් වියදමකින් තොරව ලබා ගත හැකි ආහාර (වියළි ධාන්‍ය වර්ග, වේලන ලද බත්, පෙති කර බදින ලද අල වර්ග) පාරිභෝජන ප්‍රවර්ධන වැඩසටහන් හඳුන්වාදීම.

ඖෂධ හා රසායනාගාර ගාස්තු හා සෞඛ්‍ය උපකරණවල මිල ඉහළයෑම හේතුවෙන් එකී භාණ්ඩ හා සේවා පාරිභෝජනය සීමා කර හෝ අත්හිටුවා ඇති ආබාධිත හා නිදන්ගත රෝගීන්ගේ සෞඛ්‍ය තත්ත්වය අයහපත්වී ඇති හෙයින් අනවශ්‍ය වියදම් සීමාකිරීම හා අත්හිටුවීම මගින් සෞඛ්‍ය වියදම් සඳහා ප්‍රමුඛතාවය ලබා දීමේ වැදගත්කම පිළිබඳ දැනුවත් කිරීම.

ප්‍රවාහනය පිරිවැය හා කාලය අවමකර ගැනීම සඳහා එදිනෙදා අත්‍යාවශ්‍ය කටයුතු වෙනුවෙන් නිවසින් බැහැරවන අවස්ථාවලදීම අනෙකුත් සෙසු දෛනික අවශ්‍යතාවයන් සපුරා ගැනීමට හැකිවන පරිදි එදිනෙදා කටයුතු කළමනාකරණය කර ගැනීම පිළිබඳ ගෘහ කළමනාකරණ වැඩසටහනක් තුළින් ඔවුන් දැනුවත් කළ යුතුවේ.

ස්වයංරැකියා (ක්ෂුද්‍ර පරිමාණ ව්‍යවසාය) හා සම්බන්ධ අමුද්‍රව්‍ය හා නිමි භාණ්ඩ ප්‍රවාහනයේදී වියදම් ඉහළයෑම හේතුවෙන් විවිධ දුෂ්කරතාවන්ට මුහුණපා ඇති හෙයින් එකවර වැඩි තොගයක් ප්‍රවාහනය කිරීම, ලාභදායක ප්‍රවාහන මාධ්‍ය භාවිත කිරීම, ආසන්න වෙළෙඳපොල ඉලක්ක කිරීම සහ සාමූහික ප්‍රවාහන ක්‍රමයකට අනුගතවීම ආදී පිරිවැය අවමකිරීමේ ක්‍රමෝපායන් පිළිබඳ දැනුවත් කිරීම සඳහා ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් පැවැත්විය යුතුවේ.

රැකියා අහිමිවීම, ස්වයංරැකියා අඩාලවීම, මූලික වැටුපට සීමාවීම ආදී හේතු නිසා මාසික ආදායම විශාල වශයෙන් බිඳවැටී ඇති හෙයින් ආර්ථික අර්බුදයට ඔරොත්තු දෙන පරිදි අඩු පිරිවැය ශ්‍රම සූක්ෂ්ම සත්ව පාලන, ගෙවතු වගා, ජංගම වෙළෙඳාම වැනි ජීවනෝපාය සංවර්ධන උත්ප්‍රේරක වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතුවේ.

කාන්තා මූලික, මව්පියන් අහිමි හා වයෝවෘද්ධ පවුල්වල සාමාජිකයින්ගේ පෝෂණ මට්ටම ආරක්ෂා කිරීම සඳහා යැපුම් මට්ටමේ කෘෂිකාර්මික, සත්වපාලන, ගෘහ ආශ්‍රිත ආහාර නිෂ්පාදනය වැනි ක්ෂුද්‍ර පරිමාණ ආර්ථික ක්‍රියාකාරකම් ආරම්භ කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් ග්‍රාමීය මට්ටමින් ක්‍රියාත්මක කළ යුතුවේ.

ආදායම අහිමිවීම හා ක්‍රය ශක්තිය හීනවීම හමුවේ මූලික අවශ්‍යතා සපුරා ගැනීමට නොහැකි පවුල්වල පාරිභෝජනයේදී සිදුවන ගිලිහීයෑම් හා අවාසිදායක තත්ත්වයන් මගහැරවීම සඳහා සාමූහික පාරිභෝගික වැඩසටහන් කුඩා කණ්ඩායම් හා ග්‍රාමීය මට්ටමින් ප්‍රවර්ධනය කළ යුතුවේ.

සහනාධාර මුදල තම ආහාර වේල සපයා ගැනීමටවත් ප්‍රමාණවත් නොවන අතර, සහනාධාර මුදලේ ක්‍රයශක්තිය දිනෙන් දින පහළ යමින් පවතින හෙයින් මූල්‍ය සහනාධාර වෙනුවට භාණ්ඩ සහනාධාර වැඩසටහනක් කඩිනමින් ක්‍රියාත්මක කළ යුතුවේ. විශේෂයෙන්ම වයෝවෘද්ධ පවුල්වල ජීවන තත්ත්වය ඉතා අසතුටුදායක වන බැවින්, ඔවුන්ගේ ආහාර අවශ්‍යතාවවත් සපුරාලීමට හැකිවන පරිදි වැඩිහිටි සහනාධාර මුදල් වැඩි කළ යුතුය.

ආර්ථික අර්බුදය හමුවේ අඩු ආදායම්ලාභීන්ගේ පවුල්වල සමාජ ආර්ථික අවශ්‍යතා කඩවීම මත ඔවුන් තුළ ආධ්‍යාත්මික හා මානසික ගැටලු නිර්මාණයවී පවුල හා සමාජ තුළ අඩදබර, නොරිස්සුම්, කළහකාරී, කාංසාව හා නොසළකාහැරීම් මත පවුලේ හා සමාජයේ ඒකාබද්ධතා හා මානව ගුණධර්ම ගිලිහී ගොස් ඇති හෙයින් උපදේශන හා ආධ්‍යාත්මික සංවර්ධන වැඩසටහන් පවුල් මට්ටමින් හා ග්‍රාමීය මට්ටමින් ක්‍රියාත්මක කළ යුතුවේ.

බැංකු හෝ විධිමත් මූල්‍ය ආයතනවල ඉතිරිකිරීමට ප්‍රමාණවත් මුදලක් අඩු ආදායම්ලාභීන් සතුව නොපවතින හෙයින්, ප්‍රාග්ධන සම්පාදනයට හා අනාගත ආරක්ෂණය සඳහා සමෘද්ධි කුඩා කණ්ඩායම් හා ග්‍රාමීය සංවිධාන තුළ සුළු ප්‍රමාණ ඉතුරුම් වැඩසටහන් යාවත්කාලීන කිරීම හා ශක්තිමත් කිරීම කළ යුතුවේ.

උද්ධමනය හා ආර්ථික අවපාතය හමුවේ අමුද්‍රව්‍ය හා නිමි ද්‍රව්‍ය ආශ්‍රිත වෙළෙඳපොල උච්ඡාවචන හේතුවෙන් මෙතෙක් පවත්වාගෙන ගිය ක්ෂුද්‍ර පරිමාණ ව්‍යවසායන්(ස්වයංරැකියා) අඩපණ හෝ බිඳවැටී ඇති හෙයින් ඒවා ශක්තිමත් කිරීම සඳහා ව්‍යවසාය සානුබල හා දැනුවත් කිරීමේ වැඩසටහන් කඩිනමින් ක්‍රියාත්මක කළ යුතුවේ.

කොවිඩ් වසංගතය හා ආර්ථික අවපාතය හේතුකොටගෙන අඩපණවී ඇති ස්වයංරැකියා පණගැන්වීමට ප්‍රාග්ධන සංචිතයක් එකී ව්‍යවසායකයින් සතුව නොපවතින හෙයින් සමෘද්ධි බැංකුව මගින් අඩු පොළී හා සහනදායී කොන්දේසි මත ප්‍රාග්ධන සම්පාදනය සඳහා ණය වැඩසටහනක් කඩිනමින් ක්‍රියාත්මක කළ යුතුවේ. එසේම, ආපසු ගෙවීමට ඇති ව්‍යවසායකත්ව ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ සැලැස්මක් ක්‍රියාත්මක කළ යුතුවේ.

පවතින ආර්ථික අර්බුදකාරී තත්ත්වයට අනුවර්තනය වෙමින් මූලික අවශ්‍යතා සපුරා ගැනීමට හැකිවන ලෙසට අවම පිරිවැය පාරිභෝගික හා සරල ජීවන රටාවක් ඇති කිරීම සඳහා ආකල්පමය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතුවේ.

මෙම අධ්‍යයනයට අමතරව දකුණු ආසියානු කලාපීය රටවල ග්‍රාමසංවර්ධන උපායමාර්ග පිළිබඳව සමීක්ෂණ අධ්‍යයනය සිදුකර ඇත.

## 02. පුහුණු අංශය

ආයතනය විසින් ක්‍රියාත්මක කරන පුහුණු වැඩසටහන් ප්‍රධාන තේමාවන් කිහිපයක් ඔස්සේ නිර්මාණය වී ඇත. අඩු ආදායම්ලාභී ප්‍රජාවගේ සංවර්ධනය උදෙසා ඔවුන්ගේ සම්පත් හා ශක්තීන් හඳුනාගැනීම තුළ ග්‍රාමීය ප්‍රජාව සංවර්ධන මාවතට යොමුගත කිරීම සමාජ සජීවීකරණ ක්‍රියාවලියෙන් සිදුවේ. මෙම ක්‍රමවේදය තුළ ප්‍රජාව ආර්ථික ක්‍රියාකාරකම්වලට යොමුකිරීමෙන් පසු ඊට අවශ්‍ය කළමනාකරණ දැනුම ලබාදීම සඳහා ව්‍යවසායකත්ව කුසලතා සංවර්ධන පුහුණුව නිර්මාණය වී ඇත.

වර්තමාන සංකීර්ණ සමාජ ආර්ථික පසුබිම තුළ පවුල හා ගෘහයේ කාර්යභාරය ද සංකීර්ණ වී ඇත. මෙම වටපිටාව තුළ වඩා යහපත් පවුල් පරිසරයක් ගොඩනගා ගැනීම සඳහා හා පවුලේ සංවර්ධනය සඳහා ඉවහල් වන ගෘහ කළමනාකරණය හා පවුල් සංවර්ධනය පිළිබඳ පුහුණු වැඩසටහන සංවර්ධන ක්‍රියාකාරීන්ගේ හා ප්‍රජාවගේ දැනුම, ආකල්ප හා කුසලතා සංවර්ධනය සඳහා ඉලක්ක වී ඇත.

ප්‍රජාව තුළ හා සංවර්ධන ක්‍රියාකාරීන් තුළ නායකත්ව හැකියාවන් ගොඩනැංවීමත්, ග්‍රාමීය හා ප්‍රාදේශීය මට්ටමින් සංවර්ධන ව්‍යාපෘති නිර්මාණය කර ක්‍රියාවට නැංවීමට ඉවහල් වන ප්‍රජා ව්‍යාපෘති සැලසුම්කරණය හා කළමනාකරණය සඳහා පුහුණු වැඩසටහන් මෙන්ම ප්‍රජා සංවිධාන නිසි සංවර්ධන මාවතට යොමු කිරීම සඳහාත්, ප්‍රජාවට අවශ්‍ය ක්ෂුද්‍ර මූල්‍ය ක්‍රියාවලිය වඩා යහපත් කර ගැනීම සඳහාත් ඉහවල් වන පුහුණු වැඩසටහන් නිර්මාණය කර ක්‍රියාවට නංවා ඇත.

පැවති කොවිඩ් වසංගත තත්වයේ හා පසුකාලීන සමාජ ආර්ථික බලපෑම තුළ පංති කාමර පුහුණු වැඩසටහන් පැවැත්වීමට තිබූ අපහසුව නිසා මාර්ගගත ක්‍රමය ඔස්සේ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. ඒ යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල ක්ෂේත්‍ර නිලධාරීන්හට පුහුණු වැඩසටහන්වලට සම්බන්ධවීමට අවස්ථාව ලැබුණි.

**ක්‍රියාත්මක වූ වැඩසටහන :** මාර්ගගත ක්‍රමයට පුහුණු පාඨමාලා පැවැත්වීම

**අරමුණ :** සෞභාග්‍යවත් ශ්‍රී ලංකාවක් ගොඩනැගීම උදෙසා ප්‍රජාව සවිබල ගැන්වීම සඳහා පුහුණුව මගින් ක්ෂේත්‍ර නිලධාරීන්ගේ දැනුම, ආකල්ප හා කුසලතා වර්ධනය කිරීම.

**සුවිශේෂී අරමුණු :**

- සමාජ සජීවීකරණය
- දිළිඳු ප්‍රජාව සමාජ ආර්ථික වශයෙන් සවිබල ගැන්වීම සඳහා ව්‍යවසායකත්ව සංවර්ධනය
- ආර්ථික සංවර්ධනය සඳහා ක්ෂුද්‍ර මූල්‍ය උපාය මාර්ග භාවිතය
- සහභාගීත්ව නායකත්ව කුසලතා වර්ධනය
- ප්‍රජා සහභාගීත්ව ව්‍යාපෘති සැලසුම්කරණය සහ කළමනාකරණය
- ගෘහ කළමනාකරණය හා පවුල් සංවර්ධනය පිළිබඳ මූලික දැනුම , ආකපල්ප සහ කුසලතා වර්ධනය කිරීම ඉහත සුවිශේෂී අරමුණු තුළින් ග්‍රාමීය ප්‍රජාව සමාජ ආර්ථික වශයෙන් සවිබල ගැන්වීම , ග්‍රාමීය සංවර්ධන වැඩසටහන් සඳහා ප්‍රජා සහභාගීත්වය ඉහළයාම සහ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන්වල ඵලදායීතාවයේ ඉහළ යාම මෙම වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුළින් අපේක්ෂිත ප්‍රතිඵල ලෙස දැක්විය හැකිය.

**ක්‍රියාත්මක වූ ප්‍රදේශ:**

කැගල්ල, අම්පාර, පොළොන්නරුව, ගම්පහ, මාතලේ, මාතර, අනුරාධපුර, හම්බන්තොට, මොණරාගල යන දිස්ත්‍රික්කවල පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යයාල සඳහා

**මුහුණදුන් අභියෝග:**

මාර්ගගත ක්‍රමයට පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කිරීමේදී ඒ වන විට දිවයින පුරා පැවති විදුලිය විසන්ධි කිරීම් මෙම වැඩසටහන් සාර්ථකව පවත්වාගෙන යාමට අපහසු වූ මූලිකම සාධකය බවට පත් විය. තවද තාක්ෂණික උපකරණවල හිඟයද වැඩසටහන් විධිමත්ව පවත්වාගෙන යාමට නොහැකිවීමට බලපාන ලදි.

පවත්වන ලද මාර්ගගත පුහුණු වැඩසටහන් සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යයාලවල ක්ෂේත්‍ර කටයුතුවල නිරත සංවර්ධන නිලධාරීන් , ආර්ථික සංවර්ධන නිලධාරීන්, ග්‍රාම නිලධාරීන්, සමාජ සංවර්ධන නිලධාරීන්, සමෘද්ධි සංවර්ධන නිලධාරීන්, අභ්‍යාසලාභී උපාධිධාරීන්, සමාජ සේවා නිලධාරීන්, වනිතා සංවර්ධන නිලධාරීන්, කළමනාකරණ සේවා නිලධාරීන්, සමෘද්ධි කළමනාකරුවන් වැනි ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා පුහුණුව ක්‍රියාත්මක කරන ලදි.

මේ යටතේ පිළිමතලාව ග්‍රාම සංවර්ධන පුහුණු මධ්‍යස්ථානයේ හා බොරැල්ල ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය තුළ මාර්ගගත පුහුණු වැඩසටහන් 29 ක් පවත්වන ලදි. ඒ යටතේ ක්ෂේත්‍ර නිලධාරීන් 1012 ක් සඳහා පුහුණුව ලබා දෙන ලදි.

- පුහුණු වැඩසටහන - සමාජ සජීවීකරණය
- දිනය - 2022 - 02 - 23
- ප්‍රතිලාභීන් - අම්පාර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සමෘද්ධි කළමනාකරුවන් ,සංවර්ධන නිලධාරීන්, සමාජ සේවා නිලධාරීන්, ආර්ථික සංවර්ධන නිලධාරීන් , අභ්‍යාසලාභී උපාධිධාරීන් 21 දෙනෙකු සඳහා පුහුණු වැඩසටහන පවත්වන ලදී.

***පුහුණු වැඩසටහන සඳහා සමූහයක් වශයෙන් සහභාගී වෙමින් . . .***





- පුහුණු වැඩසටහන - ප්‍රජා සහභාගීත්ව ව්‍යාපෘති සැලසුම්කරණය හා කළමනාකරණය
- දිනය - 2022 - 02 - 24 සහ 25
- ප්‍රතිලාභීන් - අම්පාර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සමෘද්ධි කළමනාකරුවන් ,සංවර්ධන නිලධාරීන්, සමාජ සේවා නිලධාරීන්, ආර්ථික සංවර්ධන නිලධාරීන් , අභ්‍යාසලාභී උපාධිධාරීන් 15 දෙනෙකු සඳහා පුහුණු වැඩසටහන පවත්වන ලදී.

***පුහුණු වැඩසටහන සඳහා සමූහයක් වශයෙන් සහභාගී වෙමින්***





- පුහුණු වැඩසටහන - සහභාගීත්ව නායකත්ව කුසලතා සංවර්ධනය
- දිනය - 2022 - 03 - 10 සහ 11
- ප්‍රතිලාභීන් - වලස්මුල්ල සහ කහටගස්දිගිලිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි සංවර්ධන නිලධාරීන්, ග්‍රාම නිලධාරීන් , අභ්‍යාසලාභී උපාධිධාරීන්, කළමනාකරණ සේවා නිලධාරීන්, සමාජ සේවා නිලධාරීන්, වනිතා සංවර්ධන නිලධාරීන්, ග්‍රාම සංවර්ධන නිලධාරීන්, ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන්, ආපදා සහන සේවා සංවර්ධන නිලධාරීන් 45 දෙනෙකු සඳහා පුහුණු වැඩසටහන පවත්වන ලදී.

***පුහුණු වැඩසටහන සඳහා සමූහයක් වශයෙන් සහභාගී වෙමින්***





- පුහුණු වැඩසටහන - දිළිඳු ප්‍රජාව සමාජ ආර්ථික වශයෙන් සවිබල ගන්වීම සඳහා ව්‍යවසායකත්ව සංවර්ධනය
- දිනය - 2022 - 03 - 15 සහ 16

- ප්‍රතිලාභීන් - වලස්මුල්ල , කටුවන සහ ඕකෙවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි මූලස්ථාන සමෘද්ධි කළමනාකාරවරුන්, ව්‍යාපෘති කළමනාකාරවරුන් , ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන්, සංවර්ධන නිලධාරීන්, කළමනාකරණ සේවා නිලධාරීන්, ග්‍රාම නිලධාරීන් , තාක්ෂණ හා මානව සම්පත් ප්‍රවර්ධන නිලධාරීන්, වනිතා සංවර්ධන නිලධාරීන්, සමාජ සේවා නිලධාරීන්, ආර්ථික සංවර්ධන නිලධාරීන් , ප්‍රජා විශෝධන සංවර්ධන නිලධාරීන් , අභ්‍යාසලාභී උපාධිධාරීන් 25 දෙනෙකු සඳහා පුහුණු වැඩසටහන පවත්වන ලදී.


***පුහුණු වැඩසටහන සඳහා සමූහයක් වශයෙන් සහභාගී වෙමින්***





- පුහුණු වැඩසටහන - දිළිඳු ප්‍රජාව සමාජ ආර්ථික වශයෙන් සවිබල ගන්වීම සඳහා ව්‍යවසායකත්ව සංවර්ධනය
- දිනය - 2022 - 03 - 22 සහ 23
- ප්‍රතිලාභීන් - සූරියවැව , වීරකැටිය සහ අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි කුඩා ව්‍යාපාර සංවර්ධන නිලධාරීන් , ඵලදායිතා සංවර්ධන නිලධාරීන් , සංවර්ධන නිලධාරීන් , සමාජ සේවා නිලධාරීන්, කළමනාකරණ සේවා නිලධාරීන්, සමෘද්ධි කළමනාකාරවරුන්, ඉඩම් පරිහරණ නිලධාරී , වනිතා සංවර්ධන නිලධාරීන්, මුල් ළමාවිය සංවර්ධන නිලධාරීන් , ව්‍යවසාය සංවර්ධන නිලධාරීන් , තරුණ සේවා නිලධාරීන්, උපදේශන නිලධාරීන් 30 දෙනෙකු සඳහා පුහුණු වැඩසටහන පවත්වන ලදී.





දේශීයව ඉවතලන අමුද්‍රව්‍ය භාවිතා කරමින් Lady Green සන්නාමය යටතේ පරිසර හිතකාමී නිර්මාණශීලී නිෂ්පාදන තුළින් වෙළඳපළ ලෝකය ජය ගත් නිරෝෂිණී රත්නින්ද මහත්මිය මෙම පුහුණු වැඩසටහන සඳහා පරිසර හිතකාමී නිෂ්පාදන පිළිබඳව සහ කාන්තා ව්‍යවසායිකාවන් සවිබලගැන්වීමේ වැදගත්කම පිළිබඳව පුහුණුලාභීන් දැනුවත් කරන ලදි. කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවෙහි වෘත්තීය මාර්ගෝපදේශන නිලධාරී සී. එම්. ධම්මිකා ජයමිණී මහත්මිය තරුණ ව්‍යවසායකත්වය නංවාලීමේ වැදගත්කම සම්බන්ධයෙන් පුහුණුලාභීන් දැනුවත් කරන ලදි.



පුහුණු වැඩමුළුව සඳහා සහභාගී වූ නිලධාරීන් පිරිසක් . . . . .

- පුහුණු වැඩසටහන - ප්‍රජා සහභාගීත්ව ව්‍යාපෘති සැලසුම්කරණය හා කළමනාකරණය
- දිනය - 2022 - 03 - 31 සහ 2022 – 04 – 01
- ප්‍රතිලාභීන් - මාවනැල්ල , අරණායක, දෙව්නුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි ආර්ථික සංවර්ධන නිලධාරීන්, සමෘද්ධි සංවර්ධන නිලධාරීන් , සංවර්ධන නිලධාරීන් , සංවර්ධන ක්ෂේත්‍ර සහකාරවරුන් , කළමනාකරණ සේවා නිලධාරීන් , බෞද්ධ කටයුතු සමායෝජකයින් , තාක්ෂණ නිලධාරීන් ඇතුළුව නිලධාරීන් 44 දෙනෙකු සඳහා පුහුණු වැඩසටහන පවත්වන ලදී.

*පුහුණු වැඩමුළුව සඳහා සහභාගී වූ නිලධාරීන් පිරිසක් . . . . .*

*දෙව්නුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය*





කැලණිය විශ්ව විද්‍යාල භූගෝල විද්‍යා අධ්‍යයන අංශයේ උපාධි අපේක්ෂකයින් 24 දෙනෙකු සඳහා සංවර්ධනය වෙමින් පවතින රටවල ග්‍රාම සංවර්ධනය පිළිබඳ දැනුවත් කිරීමේ එක් දින වැඩසටහනක් ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේ ප්‍රධාන කාර්යයාලයේදී 2022. 11. 09 වන දින පවත්වන ලදි.

**ආයතනය සඳහා බ්ලොග් අඩවිය පවත්වාගෙන යාම**

**අරමුණ :** ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේ ප්‍රකාශන අංශය මගින් නිකුත් කරනු ලබන "ප්‍රජාශක්ති" සඟරා කලාපයන්හි අන්තර්ගත ලිපි ප්‍රජාව වෙත සමීප කිරීම හා ඒ තුළින් ප්‍රජාව නව දැනුම සංවර්ධනය කිරීම

**ක්‍රියාත්මක වූ ආකාරය :**

ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේ ප්‍රධාන කාර්යාල පුහුණු අංශයේදී 2022-06-15 වන දින පැවති සාකච්ඡාවේදී "ප්‍රජාශක්ති" 2022 අප්‍රේල් කලාපයේ සිට ඉදිරියේදී පල කිරීමට නියමිත "ප්‍රජාශක්ති" කලාපයන්හි ලිපි බ්ලොග් අඩවියක් තුළද පල කිරීමේ අරමුණින් බ්ලොග් අඩවියක් නිර්මාණය කරන ලෙස අධ්‍යක්ෂතුමන් විසින් ලබා දුන් වාචික උපදෙස් මත 2022-06-16 දින බ්ලොග් අඩවිය නිර්මාණය කරන ලදි. ඒ අනුව "ප්‍රජාශක්ති" 2022 අප්‍රේල් කලාපයේ අන්තර්ගතව තිබූ ලිපි 16 ක් බ්ලොග් අඩවියට ඇතුළත් කරන ලදි. දිළිඳුකම පිටු දැකීමේ දිනය නිමිත්තෙන් නිකුත් කළ "දිළිඳුකම පිටු දැකීමේ දින සැමරුම් කලාපය 2022" හි ඇතුළත් ලිපි 05 අතිගරු ජනාධිපතිතුමන්ගේ, ගරු අග්‍රාමාත්‍යතුමන්ගේ හා ගරු සමාජ සවිබල ගැන්වීම් රාජ්‍ය අමාත්‍යතුමන්ගේ සුභාශිංසන පණිවුඩ සමගින් බ්ලොග් අඩවියට ඇතුළත් කරන ලදි. ප්‍රජාශක්ති 2022 දෙසම්බර් කලාපයෙහි අන්තර්ගත ලිපි 22ක් මෙම අඩවියට ඇතුළත් කර ඇත.

සබැඳිය : https://rdtri.blogspot.com/

**ආයතන වෙබ් අඩවිය** https://www.rdtri.gov.lk/index.php/en/

සංවර්ධන පුවත් අතුළුව ආයතනයේ ප්‍රගතිය අතුළත් කරමින් වෙබ් අඩවිය යාවත්කාලීන කරන ලදි.

**ආයතනය සඳහා Face Book පිටුවක් පවත්වාගෙන යාම**

ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේ ප්‍රධාන කාර්යාලය හා පිළිමතලාව පුහුණු මධ්‍යස්ථානය පිළිබඳව නව තාක්ෂණය ඔස්සේ සමාජ මාධ්‍ය භාවිතය තුළින් සමාජ දැනුවත් භාවය හා ප්‍රචාරණ පියවරන් ලෙස ආයතනය නමින් ෆෙස් බුක් පිටුවක් 2022.06.16 වන දින ආරම්භ කරන ලදි. එහිදී ආයතනය විසින් ක්‍රියාකාරි සැලැස්මට අනුව සිදු කරනු ලබන පුහුණු වැඩසටහන් පර්යේෂණ ප්‍රකාශන හා බාහිර ක්‍රියාකාරකම් පිළිබඳව පල කිරීම සිදු කරන ලදි.

**අරමුණ**

ආයතනය විසින් ක්‍රියාත්මක කරනු ලබන පුහුණු වැඩසටහන් , පර්යේෂණ , ප්‍රකාශන හා බාහිර ක්‍රියාකාරකම් පිළිබඳව රාජ්‍ය හා රාජ්‍ය නොවන නිලධාරීන් හා ප්‍රජාව දැනුවත් කිරීමට නව සන්නිවේදන තාක්ෂණය ඔස්සේ සමාජ මාධ්‍ය භාවිතය

**මුහුණ දුන් ගැටළු**

පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී තාක්ෂණික උපකරණවල හිඟයකට මුහුණ දීමට සිදු වූ අතර එම තත්ත්වය කාර්යයන් කාර්යක්ෂමව සිදු කිරීමට බාධාවක් බවට පත් විය.

ෆෙස් බුක් පිටුවට අවශ්‍ය ඡායාරූප ලබා ගැනීමේදී ද තාක්ෂණයෙන් ඉහළ උපකරණ නොපැවතීම හේතුවෙන් ලබා ගන්නා ඡායාරූපවල ගුණාත්මකභාවය පිළිබඳව ගැටළු පැන නැගිනි.

ෆෙස් බුක් පිටුව මගින් පල කරන ලද ආයතනය විසින් ක්‍රියාත්මක කරනු ලබන පුහුණු වැඩසටහන් , පර්යේෂණ, ප්‍රකාශන හා බාහිර ක්‍රියාකාරකම් කිහිපයක්




ආයතනය සඳහා යූ ටියුබ් නාලිකාවක් පවත්වා ගෙන යන අතර, ආයතනය මෙහෙයවන පුහුණු වැඩසටහන්වල කෙටි වීඩියෝ පට 10ක් ඇතුළත් කරමින් ආයතනය පිළිබඳව ප්‍රජාව දැනුවත් කිරීම සිදුකර ඇත.

සබැඳිය https://www.youtube.com/@ruraldevelopmenttrainingre7666

**03.** **ප්‍රකාශන හා සම්බන්ධීකරණ අංශය**


**ප්‍රජාශක්ති සඟරාව ප්‍රකාශයට පත් කිරීම.**


1. ප්‍රජාශක්ති සඟරාව ප්‍රකාශයට පත් කිරීම.

**හැදින්වීම.**

ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය ග්‍රාමසංවර්ධනය හා දිළිඳුකම පිටුදැකීම සඳහා පර්යේෂණ හා පුහුණු හා ප්‍රකාශන සිදු කරන ආයතනයකි. විශේෂයෙන්ම සංවර්ධන ප්‍රවාහයෙන් දුරස්ව සිටින ප්‍රජාව ඒ තුළට යොමු කර ගැනීම උදෙසා විවිධ ක්‍රියාකාරකම් සිදු කරනු ලබයි . ,.මෙහිදී පවුල මූලික කරගත් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුළින් ඔවුන් සවිබලගැන්වීම ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේ ප්‍රධාන මෙහෙවර වේ. මේ සඳහා මානව සම්පත සංවර්ධනය කල යුතු අතර ඒ සඳහා සංවර්ධන ක්ෂේත්‍රයේ නිරත වූවන්ගේ. .ආකල්ප හා කුසලතා ගොඩ නැංවිය යුතුය , ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේ නිලධාරින් විසින් ලියන ලද සංවර්ධන ක්ෂේත්‍රයට අදාල ලිපි හා සංවර්ධන ක්ෂේත්‍රයට අදාල අත්දැකීම් ඇතුලත් ලිපි විශාල මෙහෙයක් සිදු කරනු ලබයි.




ග්‍රාමසංවර්ධනය හා දිළිඳුකම පිටුදැකීමට අදාල ලිපි ප්‍රකාශයට පත් කිරීම ආයතනයේ ප්‍රකාශන අංශය විසින් සිදු කරනු ලබන අතර ආයතනය ආරම්භයේ සිටම ප්‍රජාශක්ති සඟරාව නමින් අර්ධ වාර්ෂිකව සඟරා දෙකක් මුද්‍රණය කරනු ලබයි. මෙම සඟරාව සඳහා ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය මෙන්ම බාහිර සමාජ වැඩ සම්බන්ධ විද්වතුන්ගෙන් ලිපි ලබා ගැනීම සිදු කරයි. මෙම සඟරාව ප්‍රජාව සමග කටයුතු කරන රාජ්‍ය නිලධාරීන් හා රාජ්‍ය නොවන ක්ෂේත්‍රයන්හි නිරත නිලධාරීන් සංවර්ධන වැඩකරුවන් සඳහා ,වෘත්තිකයන් , වඩාත් ඵලදායී වන අතර ප්‍රාදේශීය ලේකම් කාර්යාල, දිස්ත්‍රික් ලේකම් කාර්යාල, මෙන්ම ආයතනයේ සේවා ලබා ගන්නා පුහුණුලාභීන් වෙත බෙදා හැරීම තුළින් දැනුම සම්ප්‍රේෂණය කිරීම මෙතෙක් සිදුවිය. ඒ අනුව 2022 වසර තුළද සෞභාග්‍යාමත් දේශයක් තේමා කරගනිමින් ලිපි 15 ක් ඇතුලත් ප්‍රජාශක්ති 1 කලාපය හා ග්‍රාමසංවර්ධනය තේමා කරගනිමින් ලිපි 22 ක් ඇතුලත් ප්‍රජාශක්ති දෙවන කලාපය වශයෙන් ප්‍රජාශක්ති සඟරා දෙකක් අර්ධ වාර්ෂිකව ආයතනයේ වෙබ් අඩවි පිටුවේ පළ කර ඇත. එමෙන්ම දිළිඳුකම පිටුදැකීමේ දිනය වෙනුවෙන් ලිපි 05ක් ඇතුලත් ප්‍රජාශක්ති සඟරාවක් එළි දක්වා ආයතනයේ වෙබ් අඩවි පිටුවේ පළකර ඇත.

**අපේක්ෂිත අරමුණ:-**

සංවර්ධන ක්ෂේත්‍රයන්හි නිරත රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන නිලධාරීන්ට සංවර්ධන ,වෘත්තිකයන්ට , ,වැඩකරුවන් හට අධ්‍යයන කාර්යයන්හි නිරත වන්නන්ට අවශ්‍ය දැනුම ලබා දීම.

**තේමාවන් හා ඊට අදාළ තොරතුරු ලබාගත් ආකාරය:-**

වර්තමාන රජය විසින් ප්‍රකාශයට පත්කරන ලද ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුව එහි තේමාව වන්නේ සෞභාග්‍යයේ දැක්ම පෙරදැරි කරගත් වසරක් ලෙසයි. ඒ අනුව සෞභාග්‍යවත් දේශයක් ගොඩ නැංවීම යන තේමාව ඔස්සේ ලිපි ලිවීම පලමු සඟරාවෙන් සිදු කර ඇති අතර ග්‍රාමසංවර්ධනය තේමාකර ගනිමින් දෙවන කලාපය සකස් කර ඇත. දිළිඳුකම පිටු දැකීමේ දිනය වෙනුවෙන් විපර්යකාරක වැඩසටහන තේමාකර ගනිමින් 3 වන කලාපයක්ද පළ කොට ඇත. ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේ නිලධාරින් ගේ සංවර්ධන ක්ෂේත්‍රයට අදාල ලිපි හා සංවර්ධන ක්ෂේත්‍රයට අදාල අත්දැකීම් ඇතුලත් ලිපි මෙම ක්ෂේත්‍රයට ගලපා ගත හැකි අතර එම නිලධාරින්ගෙන් ලබා ගත් ලිපි මෙම සඟරාවට ඇතුලත් කර ඇත.

**තොරතුරු ප්‍රකාශයට පත් කළ ආකාරය:-**

ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයෙන් ලබා ගත් ලිපි ආයතනයේ සංස්කාරක මණ්ඩලයක් විසින් සංස්කරණය කොට සඟරා තුනක් ලෙස සකස් කර අර්ධ වාර්ෂිකව ආයතනයේ වෙබ් අඩවියේ පළ කිරීම සිදු කර ඇත.

**නිගමන හා යෝජනා:-**

**නිගමන-**

ආයතනයේ නිලධාරින්ට හා විශ්ව විද්‍යාල ආචාර්යවරුන් හා සිසුන්ට ග්‍රාමසංවර්ධනය හා විපර්යකාරක වැඩසටහන සම්බන්ධයෙන් දැනුම වර්ධනය කර ගැනීමට බෙහෙවින් ඉවහල් වූ ලේඛණයක් වීම.

ආයතනයේ නිලධාරින් අදාල තේමා ඔස්සේ ලිපි ලිවීමේදී දැනුම සොයායාම සිදුවන බැවින් ග්‍රාමසංවර්ධනය විෂය ඔස්සේ රාජකාරි කිරීමේදී එම දැනුම විශාල පිටිවහලක් වීම.

**යෝජනා-**

අර්ධවාර්ෂික ප්‍රජාශක්ති සඟරා දෙකට අමතරව විපර්යකාරක දිනය, දිළිඳුකම පිටු දැකීමේ දිනය ආදි ග්‍රාමසංවර්ධනයට අදාළ දින සැමරුම් අවස්ථාවලදී අදාල තේමා ඔස්සේ දැනුම ලබාදීමට තවතවත් ප්‍රජාශක්ති සඟරා ප්‍රමාණය වැඩි කිරීම සුදුසුය. පිටකවර නිර්මාණය පිළිබඳ ව පරිඝණක පුහුණුව අදාල නිලධාරින්ට ලබා දීම සුදුසුය.

**මුහුණ දුන් අභියෝග ගැටළු:-**

කාර්යාල නිලධාරින්ගෙන් ලිපි ප්‍රමාද වී ලැබීම හා පරිගණක අලුත් වැඩියා නොකිරීමෙන් සංස්කරණ කිරීමේදී ඇතිවන දෝෂ සඟරාව සැකසීමේදී ගැටළුවක් විය. පිටකවර නිර්මාණය බාහිරින් සිදු කර ගැනීම හා ඊට මුදල් වැය කිරීමට ප්‍රතිපාදන නොමැති වීම.

03 පරිච්ඡේදය - වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය

**04 පරිච්ඡේදය - කාර්යසාධන දර්ශක**

**1.1. ආයතනයේ කාර්යසාධන දර්ශක(ක්‍රියාකාරි සැලැස්ම මත පදනම්ව)**

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමවුමේ ප්‍රතිශතයක්(%) ලෙස තත්‍ය නිමවුම | | |
|---|---|---|---|
| | 100% - 90% | 89% - 75% | 74% - 50% |
| **නිම කරන ලද පර්යේෂණ/ සමීක්ෂණ සංඛ්‍යාව("වර්තමාන වෙළෙඳපොළ උද්ධමනය අඩු ආදායම්ලාභී පවුල්වල අර්ථිකයට කර ඇති බලපෑම" පිළිබඳ සමීක්ෂණය.)** | ✓ | | |
| 2022 වාර්ෂික සැලැස්ම පිළිබඳ සමාලෝචනය සහ 2023 වාර්ෂික සැලැස්ම සැකසීම) | ✓ | | |
| **පුහුණු වැඩසටහන් සංඛ්‍යාව සහ සහභාගිවූ පුහුණුලාභීන් සංඛ්‍යාව**(අඩු ආදායම්ලාභී පවුල් සවිබල ගැන්වීමේ කටයුතුවල නිරත සංවර්ධන මැදිහත්කරුවන් සඳහා වූ පුහුණු වැඩසටහන. | ✓ | | |
| **ප්‍රකාශන සංඛ්‍යාව** (ප්‍රජාශක්ති සඟරාව, වෙබ් ප්‍රකාශනය) | ✓ | | |
| **යාවත්කාලීන කරන ලද ලිපි සංඛ්‍යාව** (වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම) | ✓ | | |
| **ප්‍රකාශන සංඛ්‍යාව** (තරුණය පුවත් හසුන, වෙබ් පිටුව) | ✓ | | |

**05 පරිච්ඡේදය - තිරසාර සංවර්ධන අරමුණු(SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය**

| ඉලක්කය/අරමුණ | ඉලක්ක | ජයග්‍රහන දර්ශක | මේ දක්වා ජයග්‍රහන ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
| | | | 0% - 49% | 50% - 74% | 75% - 100% |
| ප්‍රජා සහභාගීත්වය වැඩි දියුණු කිරීම සඳහා අඩු ආදායම්ලාභී පවුල් සවිබල ගැන්වීම | කාන්තා සහභාගීත්වය වැඩි කිරීම සඳහා අභිප්‍රේරණ වැඩසටහනක් පැවැත්වීම | | | ✓ | |
| | ග්‍රාමීය ප්‍රජාව සහ ප්‍රජා මූලික සංවිධාන (සීබීඕ) සාමාජිකයින් සඳහා පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීම | | | | ✓ |
| | ග්‍රාමීය සංවර්ධන ක්‍රියාවලියෙහි නියැලී සිටින රජයේ නිලධාරීන් / රාජ්‍ය නොවන නිලධාරීන් සමාජ බලමුලු ගැන්වීමේ වැඩසටහන් පැවැත්වීම | | | | ✓ |
| ආර්ථික සංවර්ධනය සඳහා ග්‍රාමීය ප්‍රජාව අතර ව්‍යවසායකත්වය ප්‍රවර්ධනය කිරීම | ග්‍රාමීය ව්‍යවසායකයින් සඳහා පුහුණු හා නිපුණතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම | | | | ✓ |
| ආයතනික සේවා සැපයීම පුළුල් කිරීම | දරිද්‍රතාවය පිටුදැකීම සහ ග්‍රාමීය සංවර්ධනය පිළිබඳ පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහනක් සකස් කිරීම | | | | ✓ |
| | රාජ්‍ය නොවන සංවිධාන සඳහා නේවාසිකාගාර, දේශන ශාලාව සහ ආපනශාලා පහසුකම් සැපයීම | | | | ✓ |

**06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ**

**06.1 සේවක සංඛ්‍යා කළමනාකරණය**

| | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | ඇබෑර්තු/(අතිරික්ත)** |
|---|---|---|---|
| **ජ්‍යෙෂ්ඨ** | **05** | **03** | **02** |
| **තෘතීයික** | **13** | **12** | **01** |
| **ද්විතීයික** | **17** | **25** | **08** |
| **ප්‍රාථමික** | **11** | **08** | **03** |

**06.2 **ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න.**

වාර්ෂික සැලැස්ම තුළින් හඳුනා ගන්නා වැඩසටහන් යටතේ ආයතනික අරමුණු හා නිමවුම අපේක්ෂිත මට්ටම කරා ලඟා කර ගැනීමේ කාර්යයේ දී පවතින සේවක ඇබෑර්තු හා ගිණුම් අංශයක් ආයතනය තුළ නොමැතිවීම ද ප්‍රබල අභියෝගයක් වී ඇත.

06.3. මානව සම්පත් සංවර්ධනය.

2022 වර්ෂය තුළ ආයතන නිලධාරින්ගේ ධාරිතා සංවර්ධන අවශ්‍යතා හඳුනාගෙන ඇති අතර, ආයතනයට පුහුණු හා පර්යේෂණ නිලධාරී කාර්ය මණ්ඩලය සඳහා නව පිරිසකගේ අවශ්‍යතාවය ද අවධානයට ලක්ව ඇති ප්‍රධාන කරුණකි. එය ආයතනයේ ඉදිරි සංවර්ධන ඉලක්ක මගින් සපුරාගැනීමට අපේක්ෂිත වේ.

06.4 බාහිර ආයතන සඳහා සේවා සැපයීමෙන් ආදායම් ඉපයීම

| විස්තරය | උපයන ලද ආදායම රු: |
|---|---|
| බොරැල්ල පුහුණු මධ්‍යස්ථානය | 830,060.00 |
| පිළිමතලාව පුහුණු මධ්‍යස්ථානය | 964,179.00 |
| **එකතුව** | **1,794,239.00** |